## නව පවුල් සෞඛ්‍ය නිළධාරිනී කොට්ඨාශ ස්ථාපිත කිරීමේ මාර්ගෝපදේශය

පවුල් සෞඛ්‍ය වැඩසටහන සෞඛ්‍ය පද්ධතියේ මට්ටම් කීපයක් ඔස්සේ ක්‍රියාත්මකවේ.පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනි මට්ටම එහි මූලිකම ස්ථරය වේ. සේවාවේ ගුණාත්මකභාවය පවත්වා ගැනීම සඳහා වරින් වර පවත්වා ගත යුතු පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනි කොට්ඨාශය ගණන පිළිබඳව අවධානය යොමු කිරීම අවශ්‍ය වේ. ඒ අනුව නව කොට්ඨාශ හදුනාගත හැක අතර හි අරමුණ වන්නෙ සේවයේ ගුණාත්මක හා කාර්ය මණ්ඩලයෙ උපරිම කාර්යක්ෂමතාවය පවත්වා ගැනීමත්ය.

මෙම මාර්ගෝපදේශය අනුව ක්‍රියා කිරීමෙන් නව පවුල් සෞඛ්‍ය නිළධාරිනී කොට්ඨාශ හඳුනාගැනීම හා ස්ථාපනය කිරීම විධිමත් කිරීමට හැකියාව ලැබෙනු ඇත.

නව පවුල් සෞඛ්‍ය නිළධාරිනී කොට්ඨාශ නිර්මාණය කිරීම පහත සඳහන් පරිදි සිදු වේ.

1.නව පවුල් සෞඛ්‍ය නිළධාරිනී කොට්ඨාශ හඳුනාගැනීම

1.1 නිසි අවශ්‍යතාවයක් පවතීනම් පමණක් වසර 5කට වරක් පවුල් සෞඛ්‍ය නිළධාරිනී කොට්ඨාශ සංඛ්‍යාව සංශෝධනය කළ හැකිය.

එක් එක් පවුල් සෞඛ්‍ය නිළධාරිනී කොට්ඨාශවලට නියමිත ජනගහනය අඩු කිරීමෙන් අදාල සේවාවෙහි ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම සඳහා අදාල සෞඛ්‍ය වෛද්‍ය නිළධාරීවරයා / නිළධාරීවරිය විසින් තම සේවා ප්‍රදේශය තුල නව කොට්ඨාශ ස්ථාපනය කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගත යුතුය.

1.2 නව කොට්ඨාශ හඳුනාගැනීමේ නිර්ණායක.

එක් පවුල් සෞඛ්‍ය නිළධාරිනී කොට්ඨාශයකට නියමිත ජනගහනය දළ වශයෙන් 3000කි. මෙම සංඛ්‍යාව අදාල ප්‍රදේශයේ ජන ඝණත්වය, භූ විද්‍යාත්මක ලක්ෂණ, අවදානම් සහගත ජන කණ්ඩායම් පැවතීම ආදී කරුණු ද සැලකිල්ලට ගනිමින් නිර්ණය කළයුතුය.

ජනගහනය 3000කට එක් කොට්ඨාශයක් බැගින් නම් කර අදාල පුරප්පාඩු පිරවීමෙන් අනතුරුව, එක් කොට්ඨාශයකට නියමිත ජනගහනය, ග්‍රාමීය ප්‍රදේශවල 1500ක් හා නාගරික ප්‍රදේශවල 2500ක් වන පරිදි නව කොට්ඨාශ නිර්ණය කළ හැක. (මේ සම්බන්ධව නිකුත් කර ඇති සෞඛ්‍ය ලේකම්ගේ FHB/DIR/GF/2012 දරණ මහජන සෞඛ්‍ය සේවාවේ පුරප්පාඩු සංඛ්‍යාව තීරණය කිරීම පිළිබඳ මාර්ගෝපදේශය ද සැලකිල්ලට ගන්න.)

එක් පවුල් සෞඛ්‍ය නිළධාරිනී කොට්ඨාශයක් ග්‍රාම නිළධාරී කොට්ඨාශ එකක් හෝ කීපයකින් සමන්විත විය යුතු අතර පවුල් සෞඛ්‍ය නිළධාරිනී කොට්ඨාශයේ මායිම් හැම විටම ග්‍රාම නිළධාරී කොට්ඨාශයේ හෝ කොට්ඨාශවලට මායිම් විය යුතුය. මේ මගින් පරිපාලන අවශ්‍යතාවයන් අනෙකුත් දෙපාර්තමේන්තු හා එම ක්ෂේත්‍ර නිළධාරීන් සමඟ සම්බන්ධීකරණ කටයුතු මෙන්ම අධීක්ෂණ කටයුතු ද පහසු වනු ඇත.

එක් ග්‍රාම නිළධාරී කොට්ඨාශයක ජනගහනය, පවුල් සෞඛ්‍ය නිළධාරිනී කොට්ඨාශයකට නියමිත ජනගහනයට වඩා ඉතා වැඩි වන අවස්ථාවලදී